**ශීර්ෂය 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 10,370.43 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 8,302.98 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2,067.45 ක් හෙවත් සියයට 19.94 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 942.47 | 937.73 | 4.74 | 0.50 |
| මූලධන | 9,427.96 | 7,365.25 | 2,062.71 | 21.88 |
| **එකතුව** | **10,370.43** | **8,302.98** | **2,067.45** | **19.94** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18.00 | 17.72 | 8.00 | 11.36 | 80.00 | 30.15 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් තුනක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 1.12 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0129/000 | 0.02 |
| 6000/0000/00/0002/0181/000 | 0.72 |
| 6000/0000/00/0013/0140/000 | 0.38 |
| **එකතුව** | **1.12** |

## 2.4 විගණන නිරීක්ෂණය

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර අනෙක් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (iv) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (v) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453(1) |

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 42.70 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 33 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය එම ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ප්‍රතිපාදන සලසා තිබුණු සමහර වැය විෂයයන්ට අදාළ කාර්යයන් පූර්ණ වශයෙන් ඉටු නොකිරීම හා සමහර වැය විෂයයන්ට අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු වී තිබුණු බව අනාවරණය විය.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ විෂය අංක 15401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) භාණ්ඩාගාර පරිගණක සටහන් හා 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය අතර රු.567,822 ක වෙනසක් පැවැතුණි. එම වෙනසෙන් රු.4,782 ක් සඳහා පමණක් හේතුන් අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබූ නමුත්, ඒවා නිවැරදි කිරීමට 2017 ජූනි 13 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් අට දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.263,558 ක හිඟ හිටි ණය ශේෂයක් පැවැතුණි. එම හිඟහිටි ණය ශේෂ මාස 6 ක සිට වර්ෂ 2 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2014 හා 2016 වර්ෂවල විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවිය යුතු ණය ශේෂ රු.229,104 ක් වී තිබුණි. එම ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර 2017 ජූනි 13 දින වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඈ) සේවය අතහැර ගිය නිලධාරීන් 02 දෙනෙකුගේ අය විය යුතු රු.103,469 ක ණය ශේෂය අය කර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිජේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාලයේ ලිපියේ 3 ඡේදයට පටහැනිව නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන (මෝටර් රථ/ ජීප්/ඩබල්කැබ්) සංඛ්‍යාව 3 ක් ලෙස දක්වා තිබූ අතර, එම සීමාව ඉක්මවා නියෝජ්‍ය ඇමතිතුමා වෙත සංචිතයේ වාහනයක්ද අනුයුක්ත කර තිබුණි.

(ආ) ඇමැතිතුමා පුද්ගලිකව ජාතික පශු සම්පත් මණ්ඩලය වෙත පියවන ලද බිල් පතකට අනුව ඔහු විසින් සංචිතයේ වාහන 2 ක් 2016 පෙබරවාරි 26 දින සිට 2017 මැයි 07 දින දක්වා භාවිතා කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වාහන 51 කින් වාහන 49 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර නොතිබුණි. .

### 3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

අමාත්‍යාංශය සතු නොවන එකතුව රු.7,300,000 ක් වටිනා වාහන 03 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශ නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. එම වාහන මාස 8 ක සිට මාස 21 ක් දක්වා පරාසයක කාලයක් ධාවනයෙන් ඉවත් කර නිෂ්කාර්යව අමාත්‍යාංශයේ පරිශ්‍රයේ රඳවා ගෙන තිබුණි.

**3.4.2 බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය විසින් වෙනත් ආයතන හා ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබා දී තිබුණු ගොඩනැගිලි සම්බන්ධයෙන් ගොඩනැගිලි කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2017 ජූනි මාසය වන විටත් ගොඩනැගිලි කුලී අයකර ගෙන නොතිබුණි. 2017 ජූනි 07 දින ලබා ගත් තක්සේරු වාර්තා අනුව 2015 අප්‍රේල් මාසයේ සිට කුලියට දුන් ගොඩනැගිලිවලින් අයවිය යුතු මාසික කුලිය එකතුව රු.152,500 ක් වී තිබුණි. 2015 අප්‍රේල් මාසයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා අමාත්‍යාංශය විසින් එකතු කර ගත යුතු (මාස 21 සඳහා) කුලී ආදායම රු.3,202,500 ක් වී තිබුණත්, එම කුලී 2017 ජූනි 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) එම ගොඩනැගිලි සඳහා විදුලිය, ජලය, ආරක්ෂක සේවා ගාස්තු හා වරිපනම් ලෙස එකතුව රු.1,295,357 ක් අමාත්‍යාංශය විසින් 2015 අප්‍රේල් මාසයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී ගෙවා තිබුණි. 2017 ජූනි 30 දින වන විටත් එම වියදමෙන් රු.402,835 ක් හෙවත් වැය කළ මුදලින් සියයට 31 ක ප්‍රමාණයක් පමණක් අයකර ගෙන තිබුණි.

**3.4.3 වාහන පිළිබඳ සමීක්ෂණය**

----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වාහන පිළිබඳ සමීක්ෂණයක් 2017 නොවැම්බර් 10 දින වන විටත් පවත්වා නොතිබුණි.

**3.5 බේරුම් නොකළ බැරකම්**

----------------------------

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය එකතුව රු.241,311 ක් පමණක් වී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරිය රු.6,004,628 කින් ඉක්මවා එකතුව රු.6,245,739 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 756 සහ 757 | වාහන සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි. 1646 | අමාත්‍යාංශයේ සංචිත වාහන 26 කට අදාළව 2016 ජනවාරි මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා මාස 11 ක් සඳහා ද, වාහන 12 ට අදාළව දෙසැම්බර් මාසය සඳහා ද, දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** | |
| 2016 ඔක්තෝබර් 17 දිනැති අංක 251/2016 දරන චක්‍රලේඛයේ 3.13 ඡේදය | 2016 වර්ෂයට අදාළව ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තරයක් හා අදාළ වාර්තා, 2017 අප්‍රේල් 20 දින වන විටත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1990 ඔක්තෝබර් 30 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |

## 3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.7.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතේ වෙළෙඳ පොල මිල ස්ථායිකරණය ඇති කිරීමට මෙන්ම පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පෞද්ගලික අංශය මගින් කළමනාකරනය කරනු ලබන ශීතාගාර 5ක් ඉදිකිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 2,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. අමාතයාාංශයේ ක්‍රියාකාරි සැලැස්ම තුළ මෙම ව්‍යාපෘතිය සංවර්ධන හා සැලැසුම් අංශය යටතේ 2016 ජනවාරි මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා වූ වර්ෂයක කාලයක් තුළ නිම කිරීමට සැලැසුම් කර තිබුණි. 2017 ජූනි 26 දින වන විටත් අදාළ ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ශීතාගාර 5ක් ඉදිකිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනය සඳහා කමිටුවකට 2016 පෙබරවාරි 05 දින අමාත්‍යාංශය විසින් සාමාජිකයන් 11 දෙනෙකු වෙත ආරාධනා කර තිබුණි. 2016 පෙබරවාරි 10 දින ශක්‍යතා අධ්‍යයනය සඳහා වන පළමු කමිටු රැස්වීම පවත්වා තිබුණි. එම රැස්වීම සඳහා ආරාධනා කළ නිලධාරීන් 11 දෙනාට අමතරව තවත් නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව සාමාජිකයින් 13 දෙනෙකු සහභාගී වී තිබුණි. එම රැස්වීම සඳහා විෂය භාර අමාත්‍යවරයාද සහභාගී වී තිබුණි. එම රැස්වීමේදී උක්ත ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රදේශ 2ක හඳුනාගත් බෝග වර්ග 7 ක් සඳහා ශීතාගාර 2 ක් පමණක් ඉදිකිරීමට තීරණය කර තිබුණි.

(ii) 2016 පෙබරවාරි 10 දින පත්කළ ශක්‍යතා අධ්‍යයනය කමිටුව 2017 පෙබරවාරි 10 දින හා 2017 මාර්තු 30 දිනවල අවස්ථා 2 කදී රැස් වී තිබුණි. අමාත්‍යාංශය විසින් එම කමිටුවෙන් ශක්‍යතා අධ්‍යයන වාර්තාව අවස්ථා 05 කදී ලිඛිතව ඉල්ලීම් කර තිබුණත්, එම වාර්තාව 2016 අගොස්තු 10 දින ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාව සඳහා කමිටුවේ සභාපතිවරයාගේ අත්සන පමණක් යොදා තිබුණු අතර, අනෙක් සමාජිකයින් අත්සන් කර නොතිබුණි. යෝජනා 06 ක් ඇතුළත් කර එම වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

(iii) ව්‍යාපෘතිය අනුමත කිරීමෙන් පසුව 2017 අගෝස්තු 28 දින නැවත ශාක්‍යතා අධ්‍යයන වාර්තාවක් ඉදිරිපත් කර තිබුණු අතර එම වාර්තාවේ අවශ්‍යයෙන්ම තිබිය යුතු පහත සඳහන් විෂයයන් පිළිබඳව ශාක්‍යතාවන් ඉදිරිපත් කර නොතිබුණි.

- තාක්ෂණික ශක්‍යතාවය
- මෙහෙයුම් ශක්‍යතාවය
- නිතිමය ශක්‍යතාවය
- මූල්‍ය පිළිබඳ ශක්‍යතාවය

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ව්‍යාපෘතියට අදාළව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව හා සමාජ බලපෑම් පිළිබඳ තක්සේරුව ලබා ගැනීම සිදු කළ යුතුව තිබුණත්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එවැනි තක්සේරු කිරීමක් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවශ්‍ය නොවන බව විගණනය වෙත දන්වා තිබුණි.

### 3.7.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම

---------------------------------------

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති අතරින් පහත සඳහන් ව්‍යාපෘති වලින් කිසිදු ව්‍යාපෘතියක් සබරගමුව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ වන කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන හා දැරණියගල පශු වෛද්‍ය කාර්යාලවලත්, රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල, ඕපනායක, කුරුවිට, අයගම, නිවිතිගල, ගොඩකවෙල හා කහවත්ත පශු වෛද්‍ය කාර්යාලවලත් ක්‍රියාත්මක කර නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(අ) අභිජනන ගොවිපලවල් පිහිටුවීමේ ව්‍යාපෘතිය

(ආ) පරිසර හිතකාමී ඌරු පාලන ප්‍රවර්ධන ව්‍යාපෘතිය

(ඇ) ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන (කුඩා පරිමාණ එළු ගොවිපලවල් දිරි ගැන්වීමේ වැඩසටහන

(ඈ) දියර කිරි පාරිභෝජනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය (කුඩා පරිමාණ කිරි ගොවිපලවල ගුණාත්මක කිරි නිෂ්පාදනය ඉහල නැංවීමේ වැඩසටහන

### 3.7.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අධීක්ෂණය දුර්වලවීම

------------------------------------------------------

සබරගමුව පළාතේ සිදුකළ භෞතික විගණන පරීක්ෂාවන් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිසි අධික්ෂණයක් සිදු කර නොතිබීම නිසා රජයේ මුදල් අයථා ලෙස පරිහරණය කළ අවස්ථා පහත සඳහන් වේ.

(අ) මාවනැල්ල පශු වෛද්‍ය බල ප්‍රදේශයේ ප්‍රතිලාභියෙකු වෙත එළුවකු සහ එළිච්චියන් 10 දෙනෙකු මිලදී ගැනීම සඳහා රු.100,000 ක් ලබා දී තිබුණි. ඒ සම්බන්ධව සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වෙනත් පුද්ගලයින් භාරයේ සිටි එළුවන් පෙන්වා මෙම මුදල් ව්‍යාජ ලෙස ලබාගෙන තිබුණි.

(ii) ප්‍රතිලාභියා මාවනැල්ල නගරයේ ප්‍රධාන ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ව්‍යාපාරයක හිමිකරුවෙකු වන බවත්, මාවනැල්ල පශු වෛද්‍ය කාර්යාලයේ සත්ත්ව සංවර්ධන උපදේශක විසින් ප්‍රතිලාභී එළු ගාල ලෙස පෙන්වා දෙන ලද ගොවිපලේ හිමිකරු ලෙස වෙනත් පුද්ගලයකු කටයුතු කර තිබුණි. ඔහු විසින් පවත්වාගෙන යනු ලබන ගොවිපල ප්‍රතිලාභියා ද ඇතුළු තවත් දෙදෙනෙකු සමඟ හවුලේ පවත්වාගෙන යන බවට ප්‍රකාශ කර තිබුණි.

(iii) මෙම ගනුදෙනුවට අදාළ විකුණුම්කරු දැනට එළු අභිජනන ගොවිපලක් හෝ එළු පට්ටියක් පවත්වා ගෙන නොයන බවත්, අදාළ ස්ථානය එළු පට්ටියක් පවත්වාගෙන යාම සඳහා ඉඩකඩ නොමැති නාගරික ස්ථානයක් වී තිබුණි. කෙසේ වුවද, විකුණුම්කරු විසින් ප්‍රතිලාභියා වෙත එළුවන් 02 දෙනෙකු රු.43,000 කට අලෙවි කළ බවත්, එළුවන් 04 දෙනෙකු මේච්චලය සඳහා ලබාදුන් බවත්, තමාද එම ගොවිපලේ කොටස්කරුවෙකු බවත් ප්‍රකාශ කරන ලදී.

(iv) නමුත් පශු වෛද්‍ය කාර්යාලය විසින් සකස් කරන ලද තක්සේරු වාර්තාව අනුව මෙම සතුන් 11 දෙනා සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රු.369,450 ක් වුවද, විකුණුම්කරුගේ ප්‍රකාශය අනුව ඔහු ලබාගත් මුදල රු.43,000 ක් වී තිබුණි.

(ආ) මාවනැල්ල පශු වෛද්‍ය බල ප්‍රදේශයේ ප්‍රතිලාභියෙකු වෙත එළිච්චියන් 10 දෙනෙකු මිලදී ගැනීම සඳහා රු.100,000 ක් ලබා දී තිබුණු අතර, එම සතුන් මිලදී ගැනීමේදී එළුවන් 6 දෙනෙක් රු.66,240 කට විකුණූ බව සඳහන් කර විකුණුම්කරුවන් දෙදෙනෙකු විසින් කිසිදු අයෙකුට

එළවන් නොවිකිණූ බවත්, ඔවුන් විසින් එළවන් විකිණූ බවට ලබා දී ඇති ලිපි හා ඒවායේ අත්සන් ඔවුන්ගේ නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මේ අනුව ව්‍යාජ නම් සහ ව්‍යාජ අත්සන් යොදාගෙන ලේඛන සකස් කර එළවන් සඳහා මුදල් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**3.8 කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත සඳහන් කර ඇත.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවීමට නියමිත ආයතන ව්‍යුහයන් අතරින් ග්‍රාමීය පුනර්ජීවන අරමුදල, ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදල (මූලා) හා ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල) 2016 වර්ෂයේදීද අක්‍රියව පැවතුණි.

**(ආ) සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රියාකාරි සැලැස්ම සැකසීමේදී පැවති අඩුපාඩු හේතුවෙන් කාර්යසාධන වාර්තාව සමඟ කාර්යසාධනය අධීක්ෂණය කර නිවැරදිව තීරණ ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) කාර්යයසාධන වාර්තාවට අනුව ව්‍යාපෘති 06 කට අදාළ ක්‍රියාකාරකම් 06 ක භෞතික ප්‍රගතිය සියයට 3 ක සිට සියයට 33 ක් දක්වා පරාසයක අගයන් ගෙන තිබුණි.

(iii) දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය (කුඩා පරිමාණ කිරි ගොවිපලවල ගුණාත්මක කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහන) යටතේ එක් දිස්ත්‍රික්කයකින් ගොවීන් 20 දෙනෙකු බැගින් තෝරා ගෙන තිබුණි. ඒ අනුව රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක 2 න් ප්‍රතිලාභීන් 40 දෙනෙකු තෝරාගෙන එක් ප්‍රතිලාභියෙකුට ගවයන් දෙදෙනෙකු හෝ උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දීමට සැලැසුම් කර තිබුණි. ඒ සඳහා රු.1,200,000 ක ප්‍රතිපාදන ඇස්තමේන්තු කර තිබුණි. නමුත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 41.5 ක ප්‍රමාණයක් පමණක් උපයෝජනය කර තිබුණි.

**3.9 ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම හා අධීක්ෂණය කිරිම**

**3.9.1 ප්‍රධාන කාර්යන්ට පටහැනිව කටයුතු කිරීම.**

ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවිකර ගැනීම සඳහාත්, නිෂ්පාදකයින්, තොග වෙළෙන්දන් හා පාරිභෝගිකයින් සෘජුවම සම්බන්ධ කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ යටිතල පහසුකම් සලසා දීමෙන් නිෂ්පාදනය සඳහා තරගකාරීත්වය තුළින් කාර්යයක්ෂම ලෙස මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක කරවීමත් අරමුණු කරගෙන විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ආරම්භකර තිබුණි. කෙසේ වෙතත් ඉන් බලාපොරොත්තු වන තරගකාරී මිල නිෂ්පාදකයින් සඳහා ලබා දීමත්, පාරිභෝගිකයින් සඳහා කාර්යයක්ෂම සාධාරණ මිල යාන්ත්‍රයක් ක්‍රියාත්මක කළ බව සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.9.2 ආර්ථික මධ්‍යස්ථාන**

---------------------

ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත ආර්ථික මධ්‍යස්ථානවල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 4 ක 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන 08 ක් 2017 ජූනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. තවද, විගණනයට ඉදිරිපත් කළ මධ්‍යස්ථාන 12 ක මූල්‍ය ප්‍රකාශනද මාස 03 ක සිට වසර 02 ½ ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව විගණනයට ඉදිරිපත්කර තිබුණි. 2003 පෙබරවාරි 05 දින ආරම්භ කර තිබුණු ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයේ 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) කඩ කාමර කුලී අයකිරීම**

-------------------------

තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර සඳහා කුලී 2016 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර තිබුණි. නමුත් එම සංශෝධනයන් අනුව බදුකරුවන් විසින් කුලී නොගෙවීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට රු.3,026,750 ක් වූ බදු කුලී හිඟහිටව පැවැතුණි. එමෙන්ම ඒ සඳහා වන දඩ මුදල රු.548,800 ක්ද හිඟහිටව පැවැතුණි. එම හිඟහිටි මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**(ඇ) ආරම්භ නොකළ ආර්ථික මධ්‍යස්ථාන**

--------------------------------------

2011 හා 2013 වර්ෂවලදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු කිලිනොච්චි හා අම්පාර ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු. මිලියන 96.7 ක් හා රු.මිලියන 29.2 ක් වැය කර 2013 හා 2014 වර්ෂවලදි අවසන් කර තිබුණි. එම ආර්ථික මධස්ථාන 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**(ඉ) ඉදිකළ ආර්ථික මධ්‍යස්ථාන වෙනත් ආයතනවලට ලබාදීම**

----------------------------------------------------------

ශාක්‍යතා අධ්‍යයනයකින් තොරව ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීම හේතුවෙන් රු.මිලියන 136 ක් වැය කර ඉදිකරන ලද ආර්ථික මධ්‍යස්ථාන 3 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන හා පළාත් පාලන ආයතන වෙත ලබාදී තිබුණි.

**(ඊ) අක්‍රීයව පවතින ආර්ථික මධ්‍යස්ථානය**

---------------------------------------

2006 ජනවාරි 25 දින රු.මිලියන 21 ක් වියදම් කර ආරම්භ කර තිබුණු කඩ කාමර 25 කින් යුත් කන්දහන්දිය ආර්ථික මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාකාරි තත්ත්වයේ නොපැවැතුණි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ගොවි නිෂ්පාදන හුවමාරු

මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට හා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා ඉල්ලුම් කර තිබුණි.

**(උ) වැලිගම, දෙනිපිටිය පොල භූමියේ ඉදිකිරීමට නියමිත විශේෂ ආර්ථික මධ්‍යස්ථානය**

2014 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු. මිලියන 6.9 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අර්ධ වශයෙන් නිම කර තිබුණි. මෙම ආර්ථික මධ්‍යස්ථානය සම්බන්ධයෙන් නිරීක්ෂණ වාර්තාවක් ලබාදීමට කමිටුවක් පත් කර තිබුණි. එම කමිටුව විසින් මෙම ස්ථානය ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම අවශ්‍යතාවක් නොතිබුණු බව වාර්තා කර තිබුණි. එම මධ්‍යස්ථානය දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පැවරීමට කටයුතු කරමින් පවතින අතර වැයකර තිබුණු රු. මිලියන 6.5 කින් අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 30 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 695 | 612 | 83 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 51 | 59 | | 08 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - | - |
| | **එකතුව** | **786** | **707** | **87** | **08** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් විධිමත් පරිදි අනුමැතියක් ලබාගැනීමට අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි